**ශීර්ෂය -435 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 1.6.1 අග්‍රීම සැසඳුම් ප්‍රකාශනය

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 208 යටතේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරා තිබු වියදම රු.227,865,951ක් වුවද, එම වියදම | විගණන නිරීක්ෂණ පිළිගනිමි. එකතුව සටහන් කිරිමේදී දෝෂයක් ඇති වී ඇති බව නිරීක්ෂණය වේ. අවසාන ගිණුම | මුදල් රෙගුලාසි 208 යටතේ දරන ලද වියදම සහ අග්‍රීම සැසඳුම් ප්‍රකාශනයේ ශේෂය |

| | | |
|---|---|---|
| රු.227,891,242 ක් ලෙස අග්‍රීම සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | නැවත පිළියල කරමින් පවතින අතර රු.25,291 වෙනස හදුනාගත් වහා ම නිවැරදි කිරිමට කටයුතු කරමි. | සමාන විය යුතුය. |

**1.6.2 දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය මහින් ඉකුත් වර්ෂයේදී මිලදීගෙන තිබු රු.2,454,659 ක් වූ මූල්‍ය නොවන වත්කම් CIGAS වැඩසටහනට ඇතුලත් කර නොතිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණ ශේෂය හා දේපල පිරියත හා උපකරණ සංචිතය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි.<br><br>2020 වර්ෂයේදි මිලදී ගත් භාණ්ඩ Cigas ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර නොතිබු අතර මේවන විට ආරම්භක ශේෂය වශයෙන් **2022** වර්ෂයට Cigas වැඩ සටහනට ඇතුලත් කරඇත. | දේපල පිරියත උපකරණ මිලදී ගැනීම නිවැරදි වටිනාකමින් CIGAS ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කර ගිණුම් ගත කල යුතුය. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 446(2) අනුව අධික්ෂණ නිලධාරියා විසින් මුදල් පොත අත්සන් කර නොතිබුණි. තවද චෙක්පත් අංකය, වැය විෂය හා ගෙවීම් විස්තර ද නිසි පරිදි ඇතුලත් නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. | විධිවිධාන ප්‍රකාර මුදල් පොත යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 420 (ආ) හා 245(3) අනුව වැය ලෙජරය යාවත්කාලීන කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. | විධිවිධාන ප්‍රකාරව වැය ලෙජරය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.මිලියන 30,276ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,946ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ඉතිරිවීම් රු.මිලියන | කොරෝනා වසංගත පැවති තත්ත්වය නිසා පුනරාවර්තන වියදම් ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.28,330ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 94 ක් විය. එසේම ඉහත දැක්වූ ශුද්ධ ඉතිරි කිරීම්වලින් සියයට 99 ක් හෙවත් රු.මිලියන 28,325ක් ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරිවීම් බව නිරීක්ෂණ වූ අතර ඒ තුළ පරිපූරක ඇස්තමේන්තු යටතේ වෙන් කර තිබූ රු. මිලියන 5,200 ක ප්‍රතිපාදනද සම්පූර්ණයෙන් වැය නොකර ඉතිරි වී තිබුණි. | | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කල යුතු ඒසීඒ-2(III) ආකෘතිය අනුව සංශෝධිත වියදම් ඇස්තමේන්තුව නිවැරදිව දක්වා නොතිබීම හේතුවෙන් මූලික වියදම් හා සංශෝධිත වියදම් අතර වෙනස ප්‍රතිශතයක් ලෙස නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ඒසීඒ ආකෘති නිවැරදිව දැක්විය යුතුය. |

**2.2 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් මහින් ඉල්ලුම් කල අග්‍රිම හා මුදල් රෙගුලාසි 208 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙන් කර දී තිබූ ප්‍රතිපාදනය පිළිවෙලින් රු.මිලියන 522 ක් හා රු.මිලියන 6,921 ක් විය. කෙසේ වුවද, අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කල අග්‍රිමයන් වලින් රු.මිලියන 392ක් හෙවත් සියයට 75 ක් පමණක් ලැබී තිබූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වෙන්කර දී තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබූ මුදල රු.මිලියන 197 ක් හෙවත් සියයට 3 ක් පමණක් විය. | අයවැය මගින් රුපියල් මිලියන 30,276 ක් වෙන්කර තිබුනද අග්‍රිම ඉල්ලුම් කිරීමේදී අතැති බිල්පත් සඳහා පමණක් අග්‍රිම ඉල්ලුම් කිරීමට සිදුවේ. එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අමාත්‍යශය මඟින් අග්‍රිම ලබාදීමක් සිදු නොකරන අතර ප්‍රතිපාදන වෙන් කිරීමේ ලිපියේ පිටපත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබයි. | වෙන්කල ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කල යුතුයි |

2.3 **නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) රෙගුලාසි 66 හා 66(2) | මු.රෙ.66(2) අනුව කිසියම් වැඩසටහනක මූලධන වියදම් යටතේ ප්‍රතිපාදිත අරමුදල් ඉන් පිටතට මාරු කල නොහැකි වුවද නියැදි පරීක්ෂාවට අනුව වැඩසටහන් 01 හි අතිකාල වියදම් රු.785,398 ක් වැඩ සටහන් 02 හී | 2021.03.20 දිනැති ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යන මැයෙන් යුක්ත අභ්‍යන්තර චක්‍රලේඛයේ විධිවිධාන පරිදි පරිපාලන වියදම් වෙන් කර ගත හැකි බැවින් ඒ යටතේ ඉන්ධන, අතිකාල , ලිපි | මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රාග්ධන වියදම් වලින් දරා තිබුණි. | ද්‍රව්‍ය ආදි ගිණුම් ඉහත ප්‍රාග්ධන වැය ශිර්ෂය යටතේ ගෙවා ඇත. | |
| | (ii) මුදල් රෙගුලාසි 396 | 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කල නමුත් ගෙවිම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය මාස 06 ඉක්මවූ එකතුව රු.792,608 ක් වු චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේවන විට සේවක අර්ථසාධක අරමුදලට අදාල චෙක්පත් හැර ඉතිරි මුදල නිරවුල් කර ඇත. එම චෙක්පත් නිරවුල් කිරීමටද අවශ්‍ය කටයුතු කර ඇති අතර ඉදිරි මාසය තුල නිරවුල් කිරීමට ඉදිරිපත් වන බව දන්වමි. | -එම- |
| | (iii) මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ශේෂය රු.72,494,340 ක් වූ අතර එයින් වසර 02 ක් ඉක්ම වූ ශේෂය රු.32,085,651 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. | -එම- |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාරණ අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) ගේ 2019 මාර්තු 15 දිනැති අංක ඊඑස්ටී-4/03/එම්එස්එෆ්/0406දරන ලිපිය | සතියකට පැය 20ක් නොඉක්මන පරිදි අතිකාල දීමනා අනුමත කල හැකි නමුත් නියැදි පරික්ෂාවට අනුව එම සීමාව ඉක්මවා නිලධාරීන් 12 දෙනෙකුට එකතුව රු.411,779 ක අතිකාල දීමනා වැඩිපුර ගෙවා තිබුණි | අමාත්‍යාංශයේ ඉතා විශාල කාර්යයන් ප්‍රමාණයක් ඉතා සුළු සේවක පිරිසකගෙන් ඉටු කරවා ගැනිමට සිදුවූ බැවින් ඔවුන් විසින් කරන ලද රාජකාරි වෙනුවෙන් ඔවුන්ට අතිකාල ගෙවීමට සිදුවිය. | නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල විය යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 කාර්යභාරයන්ඉටු නොකිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 9,500ක් සහ ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 15,497 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණි. ග්‍රාමීය මාර්ග කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 20,000ක අතිරේක ප්‍රතිපාදන ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා මාර්ග අමාත්‍යාංශය මඟින් වෙන්කර දී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී පාලම් ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 8,381 ක් හෙවත් සියයට 88 ක් වැය කර නොතිබූ අතර 2022 පෙබරවාරි 03 දිනට ඉහත ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති සඳහා වෙන්කල මුළු ප්‍රතිපාදනය වූ රු. 35,497 ක මුදලින් රු.මිලියන 7,018 ක් වූ ව්‍යාපෘතිවල පමණක් වැඩ අවසන් කර තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 19.6 ක් පමණක් විය. තවද සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ මාර්ග දුර කි.මී. 2839කින් කි.මි. 536 ක පමණක් වැඩ අවසන්කර තිබූ අතර එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 18.87ක් පමණක් විය. | එකඟ වෙමි.<br>2021 වසර තුළ සංවර්ධනය කිරීමට අපේක්ෂා කළ දුර ප්‍රමාණය කි.මී. 2839ක් වුවද, 2021.12.31 දිනට වැඩ අවසන් කළ දුර කි.මී. 465.25 කි. ඉදිකරන ස්ථානය ප්‍රායෝගිව නොගැලපීම, සිමෙන්ති ඇතුළු අමු ද්‍රව්‍ය වල මිල වරින් වර ඉහල යාම, සංවර්ධන කටයුතු වල නිරත වූ සේවකයින් කොවිඩ් -19 ආසාධිතයින් වීම යනාදී බලපෑම් හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිපල ළඟා කර ගැනීමට නොහැකි විය. | සැලසුම් කල කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති කඩිනමින් නිම කිරිමට කටයුතු කල යුතුය. |

### 3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පාලම් ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේදී අඩු පිරිවැය පාලම් 1,000 ක් සහ වාහන ගමනාගමනය කල හැකි පාලම් 438ක් අදියර දෙකක් යටතේ ඉදිකිරිම සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතිගත සංස්ථාව (SD&CC) සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කොන්ත්‍රාත්තු | කොවිඩ් වසංගත තත්වය නිසා වැඩබිම් තාවකාලිකව වැසීම, බහුතර ඉදිකිරීම් කටයුතු දුෂ්කර ප්‍රදේශ වල පිහිටා තිබීම, ප්‍රවාහන දුෂ්කරතා, අමුද්‍රව්‍ය හිගය, අමුද්‍රව්‍ය මිල ඉහල යාම, වර්ෂා කාලය යනාදී අභියෝගයන්ට මුහුණ දීමට | සැලසුම් කල පරිදි ප්‍රතිපාදන උපයෝජනය කර අපේක්ෂිත කාර්ය සාධනය අත්පත් කර ගැනිම සඳහා සඳහා අවධානය යොමු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | පිරිනමා තිබුණි.අදියර I යටතේ පාලම් 149 ක් වෙනුවෙන් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD&CC) වෙත රු. මිලියන 438 ක අත්තිකාරම් ගෙවා තිබුණද, 2021 දෙසැම්බර් 31 දින වන විට පාලම් 33 ක් පමණක් ඉදි කර තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු පාලම් සංඛ්‍යාව 71ක් වී තිබුණි. අදියර II යටතේ 2021 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී පාලම් 158 ක ඉදිකිරීම සඳහා ඉහත ආයතනය වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර ඉන් බොහොමයක් මාස 06 ක කාලයක් තුල නිම කල යුතු වුවත් 2022 පෙබරවාරි 28 දින වන විටත් කිසිදු පාලමක ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. | සිදු වී තිබුණි. | |
| **(ආ)** | අදියර II යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබූ පාලම් 121 ක් අතුරින් පාලම් 68ක ප්‍රගතිය සියයට 10ට වඩා අඩු මට්ටමක පැවතුණි. | **-එම-** | **-එම-** |

**3.2** **පාඩු හා හානි**
**-------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| --------------------- | --------------------------- | ------------- |
| කි.මී.75,129 පමණක් ධාවනය කර තිබියදී හදිසි අනතුරකට භාජනය වී තිබූ අංක CAU 0786 දරණ මෝටර් රථය 2021 ජනවාරි සහ මාර්තු වලදී එකතුව රු.6,145,452 ක් වැය කරමින් අමාත්‍යාංශය මගින් අළුත්වැඩියා සිදු කර තිබුණද එම වියදම රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා රජයට එම වටිනාකමින් පාඩුවක් සිදු වී තිබුණි.කෙසේ වුවද එම හානිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි. | අංක CAU 0786 දරන මර්සිඩීස් බෙන්ස් මෝටර් රථයේ හදිසි අනතුරක් සිදු වූ බවට රථයේ රියදුරු විසින් මෙම අමාත්‍යාංශය වෙත කිසිදු දැනුම් දීමක් සිදු කර නොමැත. එබැවින් ,මෙම මෝටර් රථයේ අනතුරට අදාළව තොරතුරු කිසිවක් මෙම අමාත්‍යාංශය වෙත අනාවරණය වී නොමැති බව ද කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |

## 3.3 අනාර්ථික ගනුදෙනු

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් ලෙස මහ දෙපස රුක් රෝපණ වැඩ සටහනක් හදුනාගෙන තිබූ අතර එක් පැලයක් රෝපනය වෙනුවෙන් දරා තිබූ ශුද්ධ වියදම රු.41 ක් විය. කෙසේ වුවද මෙම අරමුණට පටහැනිව මහ දෙපස සිටුවීමට නිර්දේශ කර නොතිබූ ශාක රෝපණය හා පැල බෙදාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.763,500 ක් හෙවත් එක් පැලයක් වෙනුවෙන් රු. 925ක ශුද්ධ වියදමක් දරා තිබුණි. | මග දෙපස තුරු සෙවන වැඩසටහන යටතේ 2021 වසරේදි සිංහල අවුරුද්ද වෙනුවෙන් ගරු අමාත්‍යතුමාගේ යෝජනාවක් මත ක්‍රියාත්මක කරන ලද පැල සිටුවීමේ වැඩ සටහනේදි ආර්ථික භෝග හා පළතුරු පැල බෙදා දෙන ලදී. | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කිරීමට ක්‍රියා කිරීමේ දී ආර්ථික වශයෙන් වාසිදායක තත්ත්වයන් සැලකිල්ලට ගත යුතු වීම. |
| (ආ) | ග්‍රාමීය පාලම් ඉදිකිරීම සදහා අමාත්‍යාංශය වෙත ලැබී තිබූ යෝජනා විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රමුඛතා පදනම මත හදුනාගැනීම සදහා ආයතන දෙකක් වෙත රු. මිලියන 31.62 ක් ලබා දී තිබුණි. ඒ අනුව එම ආයතන විසින් දිස්ත්‍රික්ක 6ක ඉදිකිරීම් සිදුකල යුතු පාලම් 6,432ක් හදුනාගෙන ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද, එම පාලම් අතුරින් 2021 දෙසැම්බර් 31 දින වන විට පාලම් 13ක් පමණක් ඉදිකිරීම සදහා තෝරාගෙන තිබීම නිසා ඉහත ආයතන දෙක වෙනුවෙන් දරා තිබූ මුදල් අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. | විශ්වවිද්‍යාල මගින් තෝරා ගෙන තිබූ ඇතැම් ප්‍රමුඛ යෝජනා 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොලැබුණි. එසේ වුවත් මුල්‍යා ප්‍රතිපාදන ලැබෙන ආකාරයට ඉදිරියේ දී ප්‍රමුඛතාවය සහිත යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. | -එම- |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ තිරසාර සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් අමාත්‍යාංශ මගින් තිරසාර සංවර්ධන අරමුණු 2ක් හදුනාගෙන තිබුණද, එම අරමුණු ඉටු කර ගැනීමට අදාල ඉලක්ක හා කාර්ය සාධක දර්ශක හදුනා ගෙන නොතිබුණි. කෙසේවුවද, ග්‍රාමීය මාර්ග අංශයට අදාලව පමණක් ඉලක්ක හා කාර්ය සාධක දර්ශක හදුනාගෙන තිබූ අතර එම කාර්ය සාධක දර්ශකයන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී සමස්ත මාර්ග හා පාලම් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 49 ට වඩා අඩු මට්ටමක | පිළිතුරු ලබා දී නොමැත. | හදුනාගෙන තිබූ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිමට අදාල පියවර ගත යුතුය. |

පැවතුනි. අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවට අනුව මූල්‍යමය බාධාවන්, අමුද්‍රව්‍ය හිඟය හා මිල උච්චාවචනයන් ප්‍රගතිය කෙරෙහි සෘජු වශයෙන් බලපා ඇති බව දක්වා තිබුණි

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත තනතුරු 64 ක් පැවති අතර ඉන් පිළිවෙලින් ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක, තෘතියික මට්ටමේ එක් තනතුරක හා ද්වීතියික මට්ටමේ තනතුරු 22 ක පුරප්පාඩු පැවතුනි. | එකඟ වෙමි. | අමාත්‍යාංශයේ අවශ්‍යතාවයට අනුව බඳවා ගැනීම සිදු කල යුතු වීම. |